# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No } 2171635 10120

ෆැක්ස්
தொலைநகல
Fax } 011-

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 1488 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 19/09/2024
පැය 1740

## මාධ්‍ය නිවේදනය

**01. මාරක රිය අනතුරක් - බිංගිරිය පොලිස් වසම.**

2024.09.19 වන අද දින අළුයම් කාලයේ බිංගිරිය පොලිස් වසමේ හලාවත කුරුණෑගල මාර්ගයේ කුරුණෑගල දෙස සිට හලාවත දෙසට ගමන් ගත් ලොරි රථයක් මාර්ගයේ මැද වාඩි වී සිටි පදිකයකු හා ගැටී අනතුරක් සිදු වී ඇත. මෙම අනතුරින් බරපතළ තුවාල ලැබූ පදිකයා බිංගිරිය රෝහලට ඇතුළත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කුලියාපිටිය රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 70 වූ බිංගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. බිංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - කිළිනොච්චිය පොලිස් වසම.**

2024.09.19 වන අද දින අළුයම් කාලයේ කිළිනොච්චිය පොලිස් වසමේ කිළිනොච්චිය වට්ටච්චි මාර්ගයේ මරදනගර් වෙල්යාය අසළදී කිළිනොච්චිය දෙස සිට වට්ටකච්චි දෙසට ගමන් ගත් ටිපර් රථයක් මාර්ගයේ ගමන් ගත් පදිකයකු හා ගැටී අනතුරක් සිදු වී ඇත. මෙම අනතුරින් බරපතළ තුවාල ලැබූ පදිකයා කිළිනොච්චිය රෝහලට ඇතුළත් ඇතුළත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 22 වූ කිළිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

මෘත ශරීරය කිළිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කිළිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - කැස්බෑව පොලිස් වසම.

2024.09.19 වන අද දින උදෑසන කාලයේදී කැස්බෑව පොලිස් වසමේ කුඩමාදුව පාර බෝක්කුව අසළදී මත්තේගොඩ දෙස සිට කුඩමාදුව දෙසට ගමන් ගත් ත්‍රීරෝද රථයක් එහි රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ ඉදිරියෙන් පැමිණි තවත් ත්‍රීරෝද රථයක ගැටී පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. මෙම අනතුරින් රථය පාලනය කර ගැනීමට නොහැකි වූ ත්‍රීරෝද රථයේ රියදුරුගේ බිරිඳ බරපතළ තුවාල ලබා හෝමාගම රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 51 වූ පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචිකාරියක වේ.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කැස්බෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - පුත්තලම පොලිස් වසම.

2024.09.19 වන අද දින උදෑසන කාලයේදී පුත්තලම පොලිස් වසමේ පුත්තලම අනුරාධපුර ප්‍රධාන මාර්ගයේ 06 කණුව අසළදී අනුරාධපුර දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් ලොරි රථයක ගැටී අනතුරක් සිදු වී පුත්තලම දෙසට මුහුණලා මාර්ගයේ වැලි තීරුවේ නවතා තිබූ තවත් ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. මෙම අනතුරින් බස් රථයේ පා පාවුරුවේ ගමන් ගත් මගියෙකු බිම වැටී බස් රථයට යට වී ඇදී ගොස් බරපතළ තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් අති අතර තවත් මගියෙකු තුවාල ලබා පුත්තලම රෝහලේ ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 40 වූ වනාතවිල්ලුව ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

අනතුර සිදු කළ ලොරි රථයේ රියදුරු සහ බස් රථයේ රියදුරු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන් තොටුපල ඒකකය.

2024.09.19 වන අද දින අළුයම් කාලයේදී කටුනායක ගුවන් තොටුපල පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන් තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **තීරුබදු රහිතව අබුඩාබි සිට ගුවන් මගින් මෙරටට රැගෙන එන ලද විදේශීය දුම්වැටි 5000(කාටුන් 25) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන් තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**